# පක්ක ගොධ ජාතකය

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙවරම්හි වැඩ වසන සේක් එක් කෙළෙඹියෙකු ඇරඹ මේ ජාතකය දේශනා කළ සේක.

නිධාන කථාව:- එක් දුර ගමනක් යන පුරුෂයා සමඟ භාර්‍ය්‍යාවකට අතර මගදී හමුවූ වැද්දෙක් "දෙදෙනාම අනුභව කරව්" යයි එක් පිසූ ගොයකු දුන්නේය. ඒ පුරුෂයා භාර්‍ය්‍යාව පැන් ගෙන ඒමට යවා ගොයා සම්පූර්ණයෙන්ම අනුභව කොට භාර්‍ය්‍යාව පැමිණි කල්හි සොඳුර! ගොයා පැන ගියේ යැයි කීය. භාර්‍ය්‍යාවද පිසූ ගොයත් පැන ගියවිට කුමක්කරමුද කියා පැන් බී දෙදෙනාම දෙව්රමට ගොස් බුදුන් වැඳ එකත් පසක සිටියහ.

බුදු රජාණන් වහන්සේ උපාසිකාව! නුඹගේ ස්වාමියා නුඹට ස්නේහවන්තද? උපකරකදැයි විචාරණ ලද ඕතොමෝ ස්වාමීනි! මම නම්මොහුට හිත කැමැත්තෙමි. ස්නේහවන්ත වෙමි. උපකාර වෙමි. මොහු නම් මට එසේ ස්නේහ නැතැයි කීවාය. බුදුරජාණන්වහන්සේ උපාසිකාව මෙසේ නොසිව, යම් කලෙක නුඹගේ ගුණය මොහු දැනගන්නේද එකල මොහු නුඹට සියලු සම්පත් දෙන්නේ යයි අතීතය ගෙනහැර දැක් වූ සේක.

ජාතකකථාව:- අතීත කථාවද යට කියන ලද්දමෙනි. මෙහි වනාහි නැවතුනාවූ ඔවුන්ගේ ක්ලාන්ත බව දැන මගදී එක්වැද්දෙක් දෙදෙනාම අනුභව කරව් යයි කියා එක් පිසූ ගොයකු දුන්නේය. රාජදූතිකාව ඒගොයා වැලකින් බැදගෙන මඟට බැස්සාය. ඔවුහු ටික දුරක් ගොස් විලක් දැක ගොයා අනුභව කිරීමට නැවතුනාහ. එහිදී කුමාරයා සොඳුර, මෙහිදී මස්අනුභව කරමු. නුඹ ගොස් පියුම් පතකින් වතුර ටිකක් ගෙන එන්නැයි කීය. ඕ පැන් ගෙන ඒමට ගිය කල්හි කුමාරයා තනිවම ගොයාගේ මස් සියල්ල අනුභව කොට වලිගය කෙළවර පමණක් අත තබාගෙන බිම බලාගෙන සිට කුමාරිකාව පැමිණිවිට සොඳුරිය, ගොයාපැන ගොස් බිලයකට පිවිසුණේය. මා වහා ගොස් වල්ගය අල්ලා ගත්විට වල්ගයත් කඩාගෙන බිලයට පිවිසුනේයයි කියා මේ අල්ලාගත් වල්ග කැල්ලයයි අතේ තිබුණ වල්ගය පෙන්වීය. ඕ තොමෝ ද ස්වාමිනි, පිසූ ගොයත් පැන ගියවිට අපි කුමක්කරමුදැයි කියා ස්වාමියා සමඟ යන්නට පිටත් වූවාය. දෙදෙනාම බරණැස් නුවරට පැමිණියාහුය. පසුව කුමාරයා රජකම ලැබ ඈ අග මෙහෙසි තනතුරෙහි තැබුවේය. නමුත් කිසිම සත්කාර සම්මානයක් නොකළේය.

බෝධිසත්වයන් වහන්සේ ඈට සත්කාර කරවනු කැමැත්තෙන් රජු සමීපයේ සිට ආර්‍ය්‍යාවෙනි! ඔබගෙන් අපි කිසිවක් නොලබමු. මොකද අපි ගැන බලන්නේ නැද්දැයි දේවීන් වහන්සේගෙන් ඇසීය. ඕතොමෝ දරුව! මමද රජුගෙන් කිසිවක් නොලබමි. නුඹට අප දෙන්නේ මොනවාද? රජ තෙමේද එදා වනයේ සිට දෙදෙනාම දුකසේ එනවිට ගොයත් තනිව අනුභව කොට දැන් මට කුමක් දෙන්නේදැයි කීහ. දේවිය මෙසේ නොකියව. දේවයන් වහන්සේ එසේ නොකරන්නේයයි බොසත් තෙම කීය. එවිට දේවිය දරුව, එය නුඹට අප්‍රකටය. රජුටත් මටත් ප්‍රකටයයි කියා කීවාය.

එය අසා බෝසත් තෙම දේවයන් වහන්ස! යමෙක් තමාට මෘදු සිතින් නැමේද තමාද ඔහුට නැමෙන්නේ විය යුතුය. තමාගේ වැඩ තමාට අවුන කරන්න හුගේ වැඩ තමාද කළ යුතුය. තමාට අවැඩ කැමැත්වූහට අභිවෘඩියෙන් නොකළ යුතුය. තමා හා එක් නොවන්නා හා එක් නොවිය යුතුය. තමන් අත්හරින තැනැත්තා අත්හළ යුතුය. තමාගෙන් වෙන්වන සිතැත්තහු හා එක්නොවිය යුතුය. පක්ෂියෙක් ඵල රහිත ගස අතහැර අන් ඵලහරිත ගසක් සොයායේය. එමෙන් අන් තමාට හිතැති කෙනෙක් සොයා ගතයුත්තේ යයි කීය.

රජතෙම බෝසතුන් කියත්ම දේවියගේ ගුණ සිහි කොට සොඳුර මෙපමණ කලක් නුඹගේ ගුණ නොසලකා හැරිමි. මාගේ අපරාධ සියල්ල ඉවසූ නුඹට මේ සියලුරාජ්‍යම දෙමියි කියා ඕහට සියලු සම්පත් දුන්නේය. මොහු විසින් මැගේ ගුණ සිහිකරවන ලද්දේ යයි බෝසතුන්ට මහත් සම්පත් දුන්නේය.

බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කොට සිව්වස් දක්වා ජාතකය නිමාව වදාළ සේක. ධර්මදේශනාව සානයෙහි ඒ අඹුසැමි යුවල සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. එකල අඹුසැමි යුවල මෙකල අඹුසැමි යුවලමය. පණ්ඩිත අමාත්‍යයා නම් බුදුරජාණන් වහන්සේය.